00175

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය

නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව

නීතිවේදී උපාධි පාඨමාලාව - IV වන මට්ටම

පළමු වන අඛණ්ඩ ඇගයීම් පරීක්ෂණය - 2023/2024

**ගිවිසුම් නීතිය –LLU4805**

කාලය : පැය එකයි (01) යි

දිනය: **2024.11.08** වේලාව : පෙ.ව.09.30 - පෙ.ව.10.30

මුළු ප්‍රශ්න ගණන - දෙකයි 02

ප්‍රශ්න <u>එකකට (01)</u> පමණක් පිළිතුරු සපයන්න.

අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.

1. (i).ප්‍රතිශ්‍රය්‍යාවක් නො පවතින අවස්ථාවක දී වුවද, ඉංග්‍රීසි නීතිය හරහා වර්ධනය වූ ‘ප්‍රතිබන්ධනය නමැති මූලධර්මය’ යටතේ පොරොන්දුවක් බලාත්මක වන්නේ කෙසේ ද? ඔබගේ පිළිතුර නඩු තීන්දු ඇසුරෙන් පැහැදිලි කරන්න.

   **(ලකුණු 08)**

   (ii).රොහාන් විසින් 2023 ඔක්තෝබර් මස 17 වන දින ඔහුගේ සම්පූර්ණ අස්වැන්නම, ටොන් එකක් රු 60 000 ක් වන පරිදි විකිණිය හැකි බවට ලිපියක් මගින් මීරාට අර්පණයක් ඉදිරිපත් කරනු ලැබුවේ ය. 2023 ඔක්තෝම්බර් මස 19 වන දින එම ලිපිය මීරාට ලැබුනි. ඒ අනුව ඇය එදිනම පෙරවරු 10.30ට එම අර්පණය ප්‍රතිග්‍රහණය කරමින් ලිපියක් යැවුවා ය. කෙසේ වෙතත්, ලිපිය තැපැලේ දී නැතිවීම හේතුකොටගෙන රොහාන්ට ඇයගේ ලිපිය නො ලැබී ගියේ ය.

   රොහාන් ලිපියක් මගින් එම අර්පණය 2023 ඔක්තෝම්බර් මස 20 වන දින අවලංගු කර අතර ඒ හා සබැදි ලිපිය මීරාට 2023 ඔක්තෝම්බර් මස 22වන දින ලැබිනි. 2023 ඔක්තෝම්බර් මස 21වන දිනයේදී රොහාන් විසින් ඉහත කී සහල් තොගයෙන් ටොන් 300 ක ප්‍රමාණයක් අරුන් නමැත්තෙකුට විකිණුවේය.

   **මෙම සිදුවීමේ නීතිමය ප්‍රතිවිපාක සාකච්ඡා කරන්න. ඔබගේ පිළිතුර අදාල නඩු තීන්දු ඇසුරෙන් සනාථ කරන්න.**

   **(ලකුණු 12)**

2. (i). අර්පණයට කරනු ලබන ආරාධනාව යන්න අර්ථ දක්වා අර්පණයට කරනු ලබන ආරාධනාවේ විවිධ ආකාර සාකච්ඡා කරන්න.

   **(ලකුණු 08)**

(ii). නිමල් විසින් තමා පාවිච්චි කරන ලද මෝටර් රථය රුපියල් 1 200 000 ක මුදලකට විකිණීම සඳහා රවී සමග ගිවිසුමකට එළඹියේය. වර්ශ 2023 දී නිමල් විසින්, තමාගේ පියා රෝහල්ගත ව සිටි අවස්ථාවේ දී උපකාරී කොට ඇති බව දැන ගත් රවී එම නිසා විකුණුම් මිලෙන් රුපියල් ලක්ෂ හයක ප්‍රමාණයක් අඩු කිරීමට එකඟ විය. ඒ අනුව රවී ඉතිරි රුපියල් ලක්ෂ හයක මුදල ගෙවා අදාළ මෝටර් රථය තම සන්තකයට ගත්තේ ය. මෑතකදී නිමල් රවීගෙන් ඉතිරි රුපියල් ලක්ෂ හයක මුදල නැවත අයකරගැනීමට උත්සාහ දරයි. ඔහු තර්ක කරනුයේ ප්‍රතිය්‍ාවක් නොමැති වීම හේතුවෙන් පසුව සිදු කරන ලද මිල අඩු කිරීම බන්ධනාත්මක නොවන බවත් එම නිසා පෙර ඇතිකරගත් ගිවිසුම පමනක් බලාත්මක වන බවටයි.

(අ). ඉංග්‍රීසි නීතිය යටතේ නිමල්ගේ තර්කයේ වලංගුභාවය විමසන්න. ඔබගේ පිළිතුර නඩු තීන්දු ඇසුරෙන් සනාථ කරන්න.

(ලකුණු 08)

(ආ). ඉහත නෛතික තත්වය රෝම ලන්දේසි නීතිය යටතේ වෙනස් වේද? ඔබගේ පිළිතුරට හේතු දක්වන්න.

(ලකුණු 04)

***සියළුම හිමිකම් ඇවිරිණි***